සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development

කාන්තා, ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය - සමාජ ආරක්ෂණ අංශය
மகளிர், சிறுவர் அலுவல்கள் மற்றும் சமூக பாதுகாப்பு அமைச்சு - சமூகபாதுகாப்பு பிரிவு
Ministry of Women, Child Affairs and Social Security - Social Security Division

මගේ අංකය / எனது இல / My No: DSD/HO/05/MF/01/චක්‍ර ලේඛ
ඔබේ අංකය / உமது இல / Your No: ..........
දිනය / திகதி / Date: 2024.06.10

**සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ - 2024/04 ට පළමු එකතුව**

**සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති විධායක කමිටු / බැංකු පාලක මණ්ඩල සභාපතිවරුන්,**
**සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති/ සමෘද්ධි ප්‍රජාමූල බැංකු කළමණාකරුවන්.**

## <u>සමෘද්ධි ප්‍රජාමුල බැංකු මගින් රාජ්‍ය සේවකයින් සඳහා හඳුන්වා දෙනු ලබන "සමෘද්ධි ලක්සර"ණය යෝජනා ක්‍රමය</u>

01 රාජ්‍ය සේවකයින් සඳහා හඳුන්වා දෙනු ලබන රු.1,000,000 ලක්සර ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරිම සඳහා 2024.04.18 දින නිකුත් කරන ලද සමෘද්ධි ප්‍රජාමුල බැංකු චක්‍රලේඛ අංක 2024/04 දරණ චක්‍රලේඛය සඳහා පහත සංශෝධන සිදු කරන බව දන්වමි.

02.මුල් චක්‍රලේඛයේ ඡේද අංක 13.1,13.2 හා 13.3 හි මගින් හඳුන්වා දී ඇති පහත ගිණුම් වල කේත අංක පහත පරිදි සංශෝධන කරන බව දන්වමි.

ලැබිය යුතු ණය ගිණුම - සමෘද්ධි ලක්සර (කේත අංක -3197)
බොල් ණය ගිණුම - සමෘද්ධි ලක්සර (කේත අංක -3295)

03. සමෘද්ධි ප්‍රජාමුල බැංකු චක්‍රලේඛ අංක 2024/04 හි ඡේද අංක 5.2 සංශෝධනය කරන අතර , ණය ආපසු ගෙවීමට අවම කාලය මාස 48 සිට 30 දක්වා අඩුකරන අතර,වයස අවු 60 දක්වා සේවය කිරීමට තවදුරටත් ඇති කාලය හා වැටුපෙන් 40 % සීමාව යන කාරණාවන් පිළිබඳව සලකා ණය ආපසු ගෙවීම් කාලය තීරණය කරන ලෙසත් දන්වමි.

04. මුල් චක්‍රලේඛයේ 5.4 ඡේදයේ සංශෝධනය කරන, ණයකරුගේ හා ඇපකරුවන්ගේ 40% අවකරණ සීමාව ගණනය කිරීමේ දී , දළ වැටුප මත ගණනය කිරීම සිදු කරන ලෙස දන්වමි.

05. ලක්සර ණය යෝජනා ක්‍රමය යටතේ, ණය මුදලක් ඉල්ලුම් කිරීමේදී විශ්‍රාම වැටුපක් හිමි එක් රාජ්‍ය සේවයකුගේ (01) ඇප සුරුකුම ප්‍රමාණවත් වේ.ණයකරුගේ මාසික ණය වාරිකයට ප්‍රමාණවත් ඇප සුරැකුමක් එක් ඇපකරුවෙකුගෙන් ආවරණය නොවන විටක උපරිම ඇප කරුවන් දෙදෙනෙකු (02) ගේ සුරැකුම ලබාගත හැකිය.

06. මෙම ණය වැඩසටහන යටතේ ණය මුදලක් ඉල්ලුම් කිරීමේ දී, මේ සමඟ අමුණා ඇති නව ණය ඉල්ලුම් පත්‍රය භාවිතා කල යුතුය.

දැනටමත්, නිකුත් කර ඇති ණය ඉල්ලුම් පත්‍ර භාරගැනිමේදී, ණයකරු අදාල ග්‍රාම නිළධාරි වසමේ පදිංචි වි සිටින බවත්, ණය මුදල ලබාදීම සුදුසු බවට නිර්දේශ කර වසමේ සමෘද්ධි සංවර්ධන නිළධාරි විසින් ලිපියක් මගින් දැනුම් දිය යුතුය.

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramu

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අධ්‍යක්ෂ (පාලන හා ආයතන) / பணிப்பாளர் ( நிர்வாகம்/தாபனம்) / Director (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |

wajira

07. ණය ආපසු ගෙවිමේදී, ණය ආපසු ගෙවීම් ලේඛණයක් (Loan schedule) පරිගණක මෘදුකාංගය හරහා ලබා ගත හැක. ඒ අනුව, මාසික අවකරණය ලිපිය සකස් කරගැනීම සිදුකර ගතහැකිය.
08. මෙම නිකුතුවට අදාල උපදෙස් මෙපමණ වන අතර, අනිකුත් උපදෙස් සඳහා මුල් චක්‍රලේඛය වලංගු කර ගත යුතුය.

සී.ඩී කළුආරච්චි,
අධ්‍යක්ෂ ජනරාල්.

**පිටපත් :-**

.01 ලේකම් - කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය - කා.දැ.ස.
02 දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය- කා.දැ.ස.
03. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - අ.ක.ස.
04 දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - දැ.ස.හා අ.ක.ස.
05. ප්‍රාදේශීය ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. - අ.ක.ස.
06. දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අ.ක.ස.
07 සමෘද්ධි මහා සංගමය සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය - කා.දැ.ගැ.ස.